# සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම - 2021

අදියරගත පදනමින් රැකියා විරහිත උපාධිධාරීන් පුහුණු කිරීම යන මැයෙන් 2018.05.25 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 18/1113/805/019 ට අදාළව ගනු ලැබූ 2018.05.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට සහ එයට අනුශාංගිකව 2019.08.01 දින හා 2019.09.16 දින අභ්‍යාසලාභී පුහුණුව සඳහා උපාධිධාරීන් බඳවාගැනීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් එළඹි තීරණ, 2020.09.07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 20/1323/304/018 ට අදාළව 2020.10.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය, 2012.09.07 දිනයට සංශෝධිත 2012.02.14 දිනැති සංවර්ධන නිලධාරි සේවයේ සේවා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ 2020.11.12 , 2021.01.08 දිනැති ලිපි මගින් ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතීන් ප්‍රකාරව 2019.08.01 දින හා 2019.09.16 දිනැතිව අභ්‍යාසලාභී පුහුණුව සඳහා බඳවා ගන්නා ලද උපාධිධාරීන් සංවර්ධන නිලධාරි සේවයට 2021.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරනු ලැබේ. ඒ අනුව මෙම නිලධාරීන්ගේ පත්වීම් ලිපි සහ අනුයුක්ත කරන ලද ආයතන ප්‍රධානීන්ගේ පිටපත් එම අනුයුක්ත කරන ලද ආයතන වෙත තැපැල් මගින් යැවීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

2021.03.24 දින මධ්‍යහන 12 සිට පහත සබැඳිවලින් ඇතුළත් වී නිලධාරීන් අනුයුක්ත කරන ලද සේවා ස්ථාන දැන ගැනීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. (මේ සඳහා මීට පෙර ලබා දී ඇති භාවිත නාමය (user name) සහ මුරපදය (password) මේ සඳහා භාවිතා කරන්න.)

- 43.224.125.68.7006
- 43.224.125.68.7003
- 43.224.125.68.7000
- 43.224.125.68.7007

ඒ අනුව එම නිලධාරීන් 2021.04.01 දින සිට 2021.04.09 දින දක්වා කාලය තුළ අදාළ ආයතන ප්‍රධානීන් වෙත වාර්තා කොට **රාජකාරි භාර ගෙන** සිය පත්වීම් ලිපිය භාර ගත යුතු වේ. 2021.04.09 දින පසු වී රාජකාරි සඳහා වාර්තා කරන නිලධාරීන් සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා කටයුතු කරනු ලැබේ.

## අනුයුක්ත කර ඇති සේවා ස්ථාන

කොමිෂන් සභා/අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල පවත්නා පුරප්පාඩු සැලකිල්ලට ගෙන එම ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ, නිලධාරීන්ගේ පෞද්ගලික දුෂ්කරතා ආදිය කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කරමින් නිලධාරීන් සේවා ස්ථානවලට අනුයුක්ත කර ඇත. පත්වීම් ලිපියෙහි සඳහන් කර ඇත්තේ නිලධාරීන් අනුයුක්ත කර ඇති අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ නාමය පමණි.

- අදාළ ආයතනයට රාජකාරි සඳහා වාර්තා කොට වැඩ භාර ගැනීමෙන් අනතුරුව අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් එම නිලධාරීන් ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාල/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමට කටයුතු කරනු ඇත.

- පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලැබීමට මනාපය පළ කරන ලද/ ආයතන ප්‍රධානීන් විසින් නිර්දේශ කරන ලද රාජ්‍ය සේවයේ ආයතන තුළ පුහුණුව ලැබූ නිලධාරීන් අදාළ පරිදි පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙත යොමු කරනු ලබන අතර එම නිලධාරීන් ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරි සේවයට පත් කිරීමට කටයුතු නොකරන බව සලකනු මැනවි.

## වැටුප් ගෙවීම

මාර්තු සහ අප්‍රේල් මාසයේ රාජ්‍ය සේවයේ වැටුප් ගෙවන ක්‍රමවේදය සහ නිලධාරීන් නව සේවා ස්ථානවලට වාර්තා කරන්නේ 2021.04.01 දින සිට විම සැලකිල්ලට ගෙන මෙම නිලධාරීන්ට වැටුප් ගෙවීම සම්බන්ධව පහත පරිදි කටයුතු කරනු ලැබේ.

ස්ථිර පත්වීම් ලබන අභ්‍යාසලාභී උපාධිධාරීන් සඳහා ගෙවනු ලබන රු: 20,000/= දීමනාව 2021 මාර්තු මස සඳහා ද ගෙවීමට ප්‍රතිපාදන නිදහස් කිරීම රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නොපමාව කටයුතු කරනු ලැබේ. ඒ අනුව අභ්‍යාසලාභීන් සඳහා මාර්තු මස දීමනාව පූර්ව සේවා ස්ථාන ප්‍රධානීන් විසින් ගෙවීමට කටයුතු කළ යුතුවේ.

2021.04.09. දින වන විට එම නිලධාරීන් රාජකාරි භාර ගෙන අවසන් වන අතර එතැන් සිට සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ පිහිටුවා වැටුප් ගෙවීමට කටයුතු කරන ලෙස ආයතන ප්‍රධානීන් වෙත උපදෙස් ලබා දෙනු ලැබේ. එහිදී වැටුප් සැකසිය යුත්තේ ස්ථිර පත්වීම් දිනය 2021.01.01 ලෙස සලකා වේ.

නව සේවා ස්ථාන වෙත වාර්තා කරන නිලධාරීන් පහත ලේඛන අප්‍රමාදව ආයතන ප්‍රධානීන් වෙත භාර දෙන්නේ නම් වැටුප් සකස් කර ගෙවීම සඳහා පහසුවක් වන බව සලකනු මැනවි.

1. 2021.01.01 දින සිට නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගන්නා දින දක්වා රු: 20,000/= දීමනාව පමණක් ගෙවූ බව සනාථ කරමින් ආයතන ප්‍රධානියා විසින් ලබා දෙන ලිපිය
   (ආකෘතිය 1)

2. 2021.01.01 දින සිට නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගන්නා දිනය දක්වා නිවාඩු විස්තර

## සේවා ස්ථාන වෙනස් කිරිම

මෙම නිලධාරීන් සඳහා ස්ථිර පත්වීම් ලබාදීමට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය 2021.01.05 දිනැතිව ලැබීමෙන් පසු කොවිඩ් තත්වය මත ඇති වූ විවිධ සීමාවීම් ද මාධ්‍යයේ රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් ජේ.ජේ. රත්නසිරි මහතාගේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ මෙම නිලධාරීන් ස්ථිර පදනමින් පත් කිරීම සඳහා ආයතනවල ඇති අවශ්‍යතාවය ද හඳුනාගෙන රාජ්‍ය සේවා කොමිෂන් සභාව, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ පළාත් සභා වැනි ආයතනවල අනුමැතීන් සහ එකඟතා ලබා ගනිමින් කටයුතු කරන ලදි. තොරතුරු තාක්ෂණ විසඳුමක් (IT Solution) ආධාරයෙන් නිලධාරීන්ගේ යාවත්කාලීන තොරතුරු කැඳවීමේ සිට කෙටි කාලසීමාවක් තුළ මූලික සුදුසුකම් පරික්ෂා කිරීම් මණ්ඩල පවත්වා හඳුනාගත් සේවා ස්ථානවලට නිලධාරීන් ස්ථානගත කර 10,000 ඉක්ම වූ ස්ථිර පත්වීම් ප්‍රමාණයක් නිකුත් කිරීමට හැකි විය.

මෙහිදි නිලධාරීන් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත අනුයුක්ත කර ඇත්තේ ප්‍රාදේශීය වශයෙන් පවත්නා පුරප්පාඩු සැලකිල්ලට ගෙනය. එබැවින් නිලධාරියෙකු ස්ථාන ගත කරන ලද සේවා ස්ථානය අතිශයින් විශේෂිත වූ කරුණක් සැලකිල්ලට ගෙන හැර වෙනස් කිරීමට කටයුතු නොකරන බව අවධාරණය කරනු ලැබේ. ඒ අනුව නිලධාරීන් අනුයුක්ත කරන ලද සේවා ස්ථානය දැනගත් අවස්ථාවේ සිට කරනු ලබන කිසිදු සේවා ස්ථාන වෙනස් කිරීම් ඉල්ලීමක් භාර ගනු නොලැබේ.

කිසියම් සුවිශේෂී හේතුවක් මත සේවා ස්ථානය වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නම් පහත පරිදි කටයුතු කළ යුතුය.

1. 2021.04.01 දින නව සේවා ස්ථානයට වාර්තා කොට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් රාජකාරි භාර ගැනීම.

2. පත්වීම් ලිපිය ලබා ගැනීම.

3. ස්ථාන මාරු ඉල්ලීම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් මාර්ගගත ක්‍රමයට සිදු කිරීම.

❖ එහිදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. එබැවින් 2019 වසරේ බඳවාගත් අභ්‍යාසලාභී උපාධිධාරීන් මෙම අමාත්‍යාංශය වෙත පැමිණ සිදු කරන කිසිදු පෞද්ගලික ස්ථාන මාරු ඉල්ලීමක් සම්බන්ධයෙන් ක්‍රියා කරනු නොලබන බව නැවතත් නිවේදනය කරනු ලැබේ.

එස්. ආලෝක බණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

(ආකෘතිය 1)

මගේ අංකය : ..........................................
දිනය : ..........................................

........................................................

.......................................................
(ස්ථිර පත්වීම් ලද ආයතනයේ ලිපිනය)

## අභ්‍යාසලාභි උපාධිධාරි දීමනාව ලබා දීම

අභ්‍යාසලාභි උපාධිධාරි පුහුණු නිලධාරි ලෙස මෙම .............................................................(ආයතනය) සේවය කළ ……..........................................................................................මයා/ මිය/මෙනෙවිය වෙත අභ්‍යාසලාභි උපාධිධාරි පුහුණු දීමනාව රු: 20,000/= පමණක් 2021 ජනවාරි මස සිට මාර්තු මස දක්වා පහත පරිදි ගෙවා ඇත.

| මාසය | දීමනාව |
|---|---|
| ජනවාරි | |
| පෙබරවාරි | |
| මාර්තු | |

.......................................
(ගණකාධිකාරී)